(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 4(10).]

# පාර්ලිමේන්තුවේ අංක 4 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

නිකුත් කළේ 2021 සැප්තැම්බර් 22 බදාදා

## 2021 ඔක්තෝබර් 04 සඳුදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

835/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාව තුළ පවත්වාගෙන යනු ලබන අපනයන සැකසුම් කලාප සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් අපනයන සැකසුම් කලාපය—

(i) ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) අයත්වන භූමි ප්‍රමාණය කොපමණද;

(iii) එම භූමි ප්‍රමාණයෙන් මේ වනවිට භාවිතා කර ඇති භූමි ප්‍රමාණය කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉදිරියේදී ස්ථාපිත කිරීමට සැලසුම් කර ඇති අපනයන සැකසුම් කලාප සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

40/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව විසින් චිත්‍රපට සංරක්ෂණය සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, මේ වන විට සංරක්ෂණය කර ඇති චිත්‍රපට සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ චිත්‍රපට සංරක්ෂණයට අදාළ අංශයේ නිලධාරීන්ට චිත්‍රපට සංරක්ෂණය සඳහා විදේශ පුහුණුව ලබා දෙන්නේද;

(ii) එසේනම්, විදේශ පුහුණුව සඳහා යොමු කරනු ලබන රට සහ ආයතන කවරේද;

(iii) පසුගිය කාලය තුළ විදේශ පුහුණුව ලබා දී ඇති පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

584/2020

ගරු වේලු කුමාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව වතු වෛද්‍ය මධ්‍යස්ථාන ක්‍රියාත්මක වන බවත්;

(ii) එවැනි මධ්‍යස්ථානයක භාරකරු ලෙස වතු වෛද්‍ය සහායක තනතුර දරන්නෙකු කටයුතු කරන බවත්;

(iii) රෝගීන් පරීක්ෂා කර ඖෂධ නියම කිරීම, එම වතු වෛද්‍ය සහායකවරයා විසින් සිදු කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) වැවිලි ක්ෂේත්‍රය ආශ්‍රිතව මේ වනවිට ක්‍රියාත්මක වන වතු වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානයන්හි සේවය කරනු ලබන වතු වෛද්‍ය සහායකවරුන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම වතු වෛද්‍ය සහායකවරුන්ගේ සුදුසුකම් කවරේද;

(iv) ඔවුන්ගේ කාර්යභාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එම වතු වෛද්‍ය සහායකවරුන් විසින් ඉටු කරනු ලබන කාර්යභාරය නීත්‍යානුකූල වන්නේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1018/2020

ගරු සංජීව එදිරිමාන්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා එවකට පැවති මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය භාරව කටයුතු කළ අමාත්‍යවරයා/අමාත්‍යවරුන්ගේ නම් කවරේද;

(ii) එම අමාත්‍යාංශය යටතේ පැවති ආයතනවල නම් කවරේද;

(iii) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ඉහත අමාත්‍යාංශය යටතේ පැවතියේද;

(iv) වර්ෂ 2015 සිට 2019 දක්වා එම ආයතනය භාරව කටයුතු කරන ලද සභාපතිවරයා/සභාපතිවරුන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනයට යන්ත්‍ර සූත්‍ර මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කර තිබේද;

(ii) ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය නොකොට රු.මිලියන 670ක් වටිනා යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන තිබේද;

(iii) එම මිලදී ගැනීමේදී යම් අක්‍රමිකතාවයක් සිදු වී තිබේ නම්, එම අක්‍රමිකතාවය කවරේද;

(iv) ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ගේ නම් කවරේද;

(v) ඒ සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් සිදු කර වරදකරුවන්ට එරෙහිව පියවර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

669/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යෝජිත කුඹුක්කන් ඔය වාරි ව්‍යාපෘතිය ආරම්භ කිරීමට අපේක්ෂා කරනු ලබන දිනය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) එම වාරි ව්‍යාපෘතිය වෙනුවෙන් වැය වන මුදල් සපයා ගනු ලබන ක්‍රමවේදය කවරේද;

(iv) එම වාරි ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා ගතවන කාලය කොපමණද;

(v) එම ව්‍යාපෘතියේ අපේක්ෂිත ප්‍රතිලාභ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

979/2020

ගරු වේලු කුමාර් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වික්ටෝරියා විදුලි බලාගාරය ඉදිකිරීමේ ව්‍යාපෘතියේ සේවය කරන ලද විදේශිකයන් සඳහා කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ "දිගන විලේජ්" හි නේවාසික පහසුකම් ලබාදුන් බවත්;

(ii) එහි කාර්යාල ගොඩනැගිලි, භෝජනාගාර හා නේවාසිකාර ආදිය පවතින බවත් ;

(iii) මේ වනවිට එය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පාලනය කරනු ලබන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) "දිගන විලේජ්"හි පවතින කාර්යාල ගොඩනැගිලි, භෝජනාගාර සහ නේවාසිකාගාර සංඛ්‍යාව;

(ii) ඒවා මේ වනවිට භාවිතා කරනු ලබන කාර්යයන්;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) "දිගන විලේජ්"හි ඉදිකර ඇති යම් ගොඩනැගිල්ලක් පෞද්ගලික පාර්ශ්වයකට/ආයතනයකට ලබා දී තිබේද;

(ii) එසේ නම්, එය ලබා දෙන ලද පදනම කවරේද;

(iii) එම ගොඩනැගිල්ල ලබා දී ඇති පෞද්ගලික පාර්ශ්වයේ / ආයතනයේ නම කවරේද;

(iv) එම ප්‍රදේශයේ නීතිවිරෝධී පදිංචි කිරීම් සිදු වී තිබේද;

(v) එසේ නම්, ඊට එරෙහිව ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන් ද?

154/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ 15හි පිහිටි ශාන්ත අන්තෝනි බාලිකා මහා විද්‍යාලයේ වාණිජ උපාධි ගුරු තනතුරක සහ ඉංග්‍රීසි, රෝමානු කතෝලික, චිත්‍ර කලාව සහ දෙමළ යන විෂයයන් සඳහා එක් ගුරු පුරප්පාඩුව බැගින් පවතින බවත්;

(ii) මෙම විද්‍යාලයේ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ ද කාර්යාල සහායක, පුස්තකාල සහායක, කම්කරු සහ මුරකරු තනතුරු සඳහා එක් පුරප්පාඩුව බැගින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය මඟින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

786/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශිෂ්‍ය උපදේශන ගුරුවරුන් බඳවා ගැනීම පිණිස පැවති තරඟ විභාගයට පෙනී සිටි මුළු අයදුම්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විභාගය සමත් වූ සංඛ්‍යාව කොපමණද;

(iii) එම විභාගය සමත් වූවන්ට මේ වනතෙක් පත්වීම් ලබා දී නොමැති බව දන්නේද;

(iv) එසේ නම්, ඉහත විභාගය සමත්වූවන්ට කඩිනමින් පත්වීම් ලබාදීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

300/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) කඩුවෙල නගරයේ පවතින අධික රථ වාහන තදබදය අවම කිරීම සඳහා යම්කිසි වැඩපිළිවෙළක් රජය විසින් යෝජනා කර තිබේද;

(ii) එසේ නම්, එම වැඩපිළිවෙල කවරේද;

(iii) එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දින වකවානු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

553/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති ජාතික මාර්ග, පළාත් මාර්ග සහ ග්‍රාමීය මාර්ගවල දුර ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මාර්ග අතරින්—

(i) කාපට් අතුරා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(ii) තාර දමා ඇති මාර්ගවල දුර ප්‍රමාණය;

(iii) තාර දමා හෝ කාපට් අතුරා නොමැති මාර්ගවල දුර ප්‍රමාණය;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත (අ) හි සඳහන් ග්‍රාමීය මාර්ග ප්‍රමාණය එක් එක් පළාත් පාලන ආයතනය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ග්‍රාමීය මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

601/2020

ගරු උදයන කිරිඳිගොඩ මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) මධ්‍යම අධිවේගී මාර්ග —

(i) ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(ii) ව්‍යාපෘතියට මේ වනවිට වැය කර ඇති මුදල කොපමණද;

(iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට වැය කළ යුතු ඉතිරි මුදල කොපමණද;

(iv) ව්‍යාපෘතිය අවසන් කිරීමට යෝජිතව තිබූ දිනය කවරේද;

(v) ව්‍යාපෘතියට අදාළව පසුගිය රජය සමයේ සිදුවූ අක්‍රමිකතා/ප්‍රමාදයන් හේතුවෙන් එය අවසන් කළ හැකි යැයි අනුමාන කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු —

(i) භාර දී ඇති සමාගම් කවරේද;

(ii) ප්‍රමාද කොට ඇති සමාගම්වලට එහි ඉදිකිරීම් කටයුතු නැවත පවරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ව්‍යාපෘතියේ මහනුවර නගරයට ආසන්න අවසන් පිවිසුම ඇති ප්‍රදේශය කවරේද;

(ii) මහනුවර සිට ගලගෙදර දක්වා වූ මාර්ගයේ පවතින දැඩි වාහන තදබදය හේතුවෙන් ඒ ඔස්සේ අධිවේගී මාර්ගයට පිවිසීමට විනාඩි 30-45 අතර කාලයක් ගත වන බැවින් මහනුවර ප්‍රදේශයේ ජනතාවට පහසුවෙන් අධිවේගී මාර්ගයට ප්‍රවිෂ්ට වීමට පිවිසුම් මාර්ග සකස් කරන්නේද;

(iii) එසේ නම්, එම අධිවේගී පිවිසුම් ඉදිකරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1017/2020

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා,— මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) "අයි-රෝඩ්" ව්‍යාපෘතිය රත්නපුර දිස්ත්‍රික්කයේ ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය මඟින් කාපට් අතුරා සංවර්ධනය කිරීමට අනුමත වූ එම දිස්ත්‍රික්කයේ මාර්ගවල දිග කොපමණද;

(iii) එම ව්‍යාපෘතිය යටතේ ගිවිසුම්ගත වූ කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත එක් එක් කොන්ත්‍රාත්කරු විසින් සංවර්ධනය කිරීම සඳහා ගිවිසුම්ගත වූ මාර්ගවල නම් හා ඒවායේ දිග;

(ii) එම මාර්ග අතරින් මේ වනවිට සංවර්ධන කටයුතු අවසන් කර ජනතා අයිතියට පත් කර ඇති මාර්ගවල නම් හා ඒවායේ දිග;

(iii) මේ වනවිට වැඩ අවසන් කර නොමැති මාර්ගවල නම් හා ඒවායේ දිග;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) වැඩ අවසන් කර නොමැති මාර්ග සංවර්ධනය කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

730/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා, — ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට, — (2)

(අ) ශ්‍රී ලංකාවේ —

(i) වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය සහ අවශ්‍යතාවය කොපමණද;

(ii) ඉහළම මිරිදිය මත්ස්‍ය අස්වැන්නක් ලබා දෙන දිස්ත්‍රික්කය කවරේද;

(iii) එම කර්මාන්තයේ නියැලෙන මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ —

(i) මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ජීවිකාව කරගත් පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) මාසික මිරිදිය මත්ස්‍ය අස්වැන්න කොපමණද;

(iii) එම කර්මාන්තය සිදුකරන වැව් හා ජලාශ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා පොළොන්නරුව දිස්ත්‍රික්කයේ වැව් හා ජලාශවලට මුදාහරින ලද මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඉහත කාලය තුළ එම වැව් හා ජලාශවලින් ලද අස්වැන්න වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුදා හරින ලද මත්ස්‍ය පැටවුන්ට සාපේක්ෂව ලද අස්වැන්න පිළිබඳව සෑහීමකට පත්වන්නේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) කුඩා වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය සඳහා ගත් ක්‍රියාමාර්ග කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

143/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලංකා විදුලිබල මණ්ඩලය විසින් ණය ලබා ගෙන ඇති රාජ්‍ය ආයතනවල සහ බැංකුවල නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ලංකා විදුලිබල මණ්ඩලය විසින් එකී ආයතනවලට හා බැංකුවලට ගෙවීමට ඇති ණය ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ලංකා විදුලිබල මණ්ඩලය මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

272/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ 2017 වර්ෂයේදී අභ්‍යන්තර අලුත්වැඩියා කටයුතු සිදුකර ඇති බවත්;

(ii) එහිදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය උල්ලංඝනය කරමින් කටයුතු කර ඇති බවත්;

(iii) ඒ හේතුවෙන් විශාල මූල්‍යමය පාඩුවක් සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අලුත්වැඩියා කටයුතු සඳහා ටෙන්ඩර් කැඳවා තිබේද;

(ii) එසේ නම්, ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද ආයතනවල නම් කවරේද;

(iii) එම එක් එක් ආයතනය ඉදිරිපත් කරන ලද ටෙන්ඩරයේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) අදාළ ටෙන්ඩරය ප්‍රදානය කරන ලද ආයතනයේ නම කවරේද;

(v) එම ආයතනයට එම ටෙන්ඩරය ප්‍රදානය කිරීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අදාළ ටෙන්ඩරය ප්‍රදානය කරන ලද ආයතනයේ කාර්ය මණ්ඩල සාමාජිකයෙකු හා ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලයේ ප්‍රවාහන අංශයේ ලිපිකරුවෙකු අතර ඥාති සම්බන්ධතාවයක් පවතින බව දන්නේද;

(ii) නොඑසේ නම්, ඒ පිළිබඳව පරීක්ෂණයක් සිදුකරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

42/2020

ගරු හේෂා විතානගේ මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කය තුළ තිබෙන පළාත් සභාවට අයත් මාර්ග සංඛ්‍යාව;

(ii) ඒවායේ මුළු දිග කිලෝමීටර;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය රජයේ කාලසීමාව තුළ පළාත් සභා ප්‍රතිපාදන මත සංවර්ධනය කරනු ලැබූ මාර්ගවල නම් කවරේද;

(ii) ඒ සඳහා වැය කළ මුදල කොපමණද;

(iii) දැනට අබලන් තත්ත්වයේ පවතින සෙසු පළාත් සභා මාර්ග සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

139/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග;

(ii) එම වැඩසටහන යටතේ මේ වනතෙක් රැකියා ලබා දී ඇති උපාධිධාරීන්ගේ නම්;

(iii) ඔවුන්ගේ සේවා ස්ථාන;

(iv) ඔවුන්ගේ රාජකාරිවල ස්වභාවය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

580/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහාම එක් ප්‍රාදේශීය සභාවක් බැගින් පිහිටුවා ඇති බවත්;

(ii) මේ වනතෙක් ප්‍රාදේශීය සභාවක් පිහිටුවා නොමැති මන්නාරම දිස්ත්‍රික්කයේ මඩු, මුලතිව් දිස්ත්‍රික්කයේ ඔඩ්ඩුසුඩාන්, කිළිනොච්චි දිස්ත්‍රික්කයේ කණ්ඩාවලෙයි සහ යාපනය දිස්ත්‍රික්කයේ වෙත්තිලකර්ණි යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සඳහා ප්‍රාදේශීය සභා පිහිටුවන ලෙසට අඛණ්ඩව ඉල්ලීම් කළද මේ වනතෙක් එම ඉල්ලීම් ඉටු කර නොමැති බවත්;

(iii) මඩු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් සින්නවලයන්කට්ටු, කාක්කයන්කුලම්, කල්මඩු පියවර-II, ඉරණෛයිඉලුප්පෙයික්කුලම් යන ගම්වල ජීවත්වන ජනතාවට සිය අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කි.මී. 70ට වඩා වැඩි දුරක් ගෙවා මාන්තෙයි බටහිර ප්‍රාදේශීය සභාව වෙත යාමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, අදාළ ප්‍රාදේශීය සභා 04 පිහිටුවීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

325/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික උරග සහ සර්ප විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති උරග සහ සර්ප විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික උරග සහ සර්ප විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික උරග සහ සර්ප විශේෂ පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික උරග සහ සර්ප විශේෂ ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

326/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වනජීවී හා වනසංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට ආවේණික ඒකදේශික උභයජීවී විශේෂ සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් වඳවීයාමේ තර්ජනයට ලක්වීමෙන් රතු දත්ත පොතට ඇතුළත් කර ඇති උභයජීවී විශේෂ කවරේද;

(iii) මේ වනවිට වඳවී ගොස් ඇති ඒකදේශික උභයජීවී විශේෂ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඒකදේශික උභයජීවීන් පිළිබඳ මෑතකදී සමීක්ෂණයක් සිදුකර තිබේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) නොඑසේ නම්, එවැනි සමීක්ෂණයක් සිදු කරන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ඒකදේශික උභයජීවීන් ආරක්ෂා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

(iii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

579/2020

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් උතුරු පළාතේ එක් එක් දිස්ත්‍රික්කයෙන් පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ප්‍රමාණය උතුරු පළාතේ සමස්ත භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මෙලෙස ඉඩම් පවරා ගැනීමේදී, පෞද්ගලික ඉඩම්, කෘෂිකාර්මික වැව්, කෘෂිකාර්මික ඉඩම් සහ පශු සම්පත් සඳහා වූ තෘණ භූමි ඉඩම් ද පවරාගෙන ඇති අතර එය ජනතාවගේ ජීවනෝපායට මෙන්ම සහජීවනයටද අහිතකර ලෙස බලපෑම් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) උක්ත ඉඩම් පවරා ගැනීමේදී දිස්ත්‍රික් ලේකම්වරයාගේ, ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහ පළාත් ඉඩම් කොමසාරිස්වරයාගේ උපදෙස් ලබා නොගැනීමට හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

533/2020

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටි රජයට අයත් වන ඔසුසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ඔසුසල් පිහිටා ඇති ස්ථානවල ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) රජයේ ඔසුසල් ශාඛා ජාලය, අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

594/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කිළිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව;

(ii) එම රෝහලේ මේ වනවිට සිටින සේවක සංඛ්‍යාව;

(iii) එම රෝහලේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව;

(iv) රෝහලේ රාජකාරියේ යෙදී සිටින වෛද්‍යවරුන් සහ හෙදියන්ගේ සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව වෙන් වෙන් වශයෙන්;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කිළිනොච්චි දිස්ත්‍රික් මහ රෝහල සඳහා හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකයක් ඉදිකිරීම සඳහා 2019.02.15 දින මුල්ගල් තැබූ බව දන්නේද;

(ii) එම ඒකකය ඉදිකිරීම සඳහා මුදල් වෙන් කර තිබේද;

(iii) එසේ නම්, එම ඉදිකිරීම් කටයුතු මේ වනතෙක් ආරම්භ නොකිරීමට හේතු කවරේද;

(iv) මුදල් වෙන් කර නොමැති නම්, ඒ සඳහා හේතු කවරේද;

(v) එම රෝහලේ හදිසි අනතුරු ප්‍රතිකාර ඒකකය ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

621/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් තනතුරු නාමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පුරප්පාඩු පිරවීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

622/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වෛද්‍ය සභාව යටතේ ලියාපදිංචි වී සිටින මුළු වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් වෛද්‍යවරුන් අතර සුදුසුකම් නොමැති වෛද්‍යවරුන් ද සිටින බව දන්නේද;

(iii) එසේ නම්, ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

170/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාලබේ සිට කොළඹ-කොටුව දක්වා සැහැල්ලු විදුලි දුම්රිය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබූ බවත්;

(ii) එම ව්‍යාපෘතිය සඳහා පාංශු පරීක්ෂාව හා ඉඩම් අත්පත්කර ගැනීමට අදාළ මැනුම් කටයුතු සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේනම්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

245/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කපු ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම කපු ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම කපු ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කපු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

273/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහන විශාල ප්‍රමාණයක් පවතින බවත්;

(ii) මෙම වාහන දිරාපත් වෙමින් පවතින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරන ලද වාහනවල වර්තමාන වටිනාකම කොපමණද;

(ii) එම වාහන පිළිබඳව සංගණනයක් සිදු කර තිබේද;

(iii) එසේ නම්, එම සංගණනය සිදු කරන ලද දිනය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) රාජ්‍ය ආයතනවල භාවිතයෙන් පසු ඉවත් කරනු ලබන වාහන බැහැර කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ගය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

416/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2018 සහ 2019 යන වර්ෂවල —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(iii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටර ප්‍රමාණය;

(ii) 2020 වර්ෂයේදී ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල;

කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2018-2019 යන වර්ෂවල සහ 2020 වර්ෂයේ ශ්‍රී ලංකාවේ නිෂ්පාදනය කරන ලද එතනෝල් ලීටරයක් අළෙවි කරන ලද මිල ගණන් අතර වෙනසක් තිබේද;

(ii) එසේ නම්, එම වෙනස කොපමණද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1277/2020

ගරු තිස්ස අත්තනායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015.01.01 දින සිට 2020.10.01 දින දක්වා ශ්‍රී ලංකා රජය විසින් විදේශ රටවල්වලින්, විදේශ නියෝජිත ආයතනවලින් හා බැංකුවලින් ලබා ගෙන ඇති ණය සහ ආධාර ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ණය සහ ආධාර ලබා ගත් අරමුණ, ව්‍යාපෘතිය, වර්ෂය, රට හා අවශ්‍යතාවය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ණය සහ ආධාර, ඒවා ලබා ගත් නිශ්චිත අරමුණ වෙනුවෙන් යොදවා ඇති බවට සහතික වන්නේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

854/2020

ගරු අජිත් රාජපක්ෂ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කොළඹ 05, කිරිමණ්ඩල මාවත යන ලිපිනයේ පවත්වාගෙන යනු ලබන සී/ස ආසිරි ශල්‍ය රෝහල පිහිටි ඉඩම, එම රෝහල ඉදිකිරීමට ප්‍රථම රජය සතුව පැවති ඉඩමක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දුන් පදනම කවරේද;

(ii) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දීමේදී, එළැඹී ගිවිසුමේ සහතික කළ පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1801/2021

ගරු රෝහණ දිසානායක මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනතාවට ලබා දෙන ලද රජයේ ඉඩම් සඳහා නිකුත් කර ඇති ඔප්පු වර්ගවල නම් කවරේද;

(ii) එම ඔප්පු වර්ග අතරින් පසු උරුමකරු නම් කර ලබා දෙනු ලබන ඔප්පු වර්ගවල නම් කවරේද;

(iii) එම ඔප්පු යටතේ ලබා දෙන ලද ඉඩම්, පවුලේ සෙසු සාමාජිකයන් අතර නීත්‍යානුකූල ලෙස පහසුවෙන් බෙදා දීම සඳහා ක්‍රමවේදයක් සැකසීමට අමාත්‍යාංශය පියවර ගෙන තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

604/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මහඉලුප්පල්ලම පිහිටි ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් වන සම්පූර්ණ භූමි ප්‍රමාණය;

(ii) ඒ අතරින් බීජ නිෂ්පාදන මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iii) ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iv) ගොවිපොළ යාන්ත්‍රික මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(v) වගා කටයුතුවලට යොදා නොගන්නා භූමි ප්‍රමාණය;

අක්කරවලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වගා කටයුතු සඳහා යොදා නොගන්නා භූමි ප්‍රමාණය වගා කටයුතු සඳහා යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

38/2020

ගරු හේෂා විතානගේ මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 1983 වර්ෂයේදී සිවිල් යුදමය තත්ත්වය ආරම්භ වීමට පෙර උතුරු පළාතේ පැවති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට අයත් ඉන්ධන පිරවුම්හල්—

(i) සංඛ්‍යාව;

(ii) පිහිටා තිබූ ස්ථානවල ලිපිනයන්;

(iii) එම ඉන්ධන පිරවුම්හල්වල අයිතිකරුවන්ගේ නම්;

(iv) ඔවුන්ගේ ලිපිනයන්;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ) (iii) හි සඳහන් අයිතිකරුවන් අතරින් උතුරු පළාතේ පැවති සිවිල් යුදමය කාලසීමාව තුළ ඝාතනය වීමෙන්, අතුරුදහන් වීමෙන් හෝ මියයෑමෙන් එම පිරවුම්හල්වල අයිතිය වෙනස් වූයේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම පිරවුම්හල්වල නව අයිතිය ලබා ගත් අයිතිකරුවන්—

(i) සංඛ්‍යාව;

(ii) ඔවුන්ගේ නම්;

(iii) ලිපිනයන්;

(iv) පසු අයිතිකරුට, මුල් අයිතිකරුගේ ඥාතීත්වයක් තිබේ නම්, එම ඥාතීත්වය;

කවරේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්,ඒ මන්ද?

1019/2020

ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන් තොටුපළ ශ්‍රී ලංකාවට සම්පතක් වන බවත්;

(ii) පසුගිය රජය සමයේදී එහි වී ගබඩා කරන ලද බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ගුවන් තොටුපළ තුළ වී ගබඩා කිරීමට හැකියාවක් තිබේද;

(ii) එම ගුවන් තොටුපළේ වී ගබඩා කරන ලද ස්ථානය කවරේද;

(iii) ගබඩා කරන ලද වී ප්‍රමාණය කොපමණද;

(iv) ඒ සඳහා උපදෙස් දෙන ලද පුද්ගලයන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වී ගබඩා කර තැබීමෙන් පසු එම පරිශ්‍රය යළි ප්‍රතිසංස්කරණය කිරීම සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) ඒ සඳහා වගකිව යුතු පුද්ගලයන්ගෙන් එම මුදල අයකර ගැනීමට කටයුතු කර තිබේද;

(iii) නොඑසේ නම්, ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) ජාත්‍යන්තර ගුවන් තොටුපළක් තුළ වී ගබඩා කිරීමෙන් ශ්‍රී ලංකාව අන්තර්ජාතික වශයෙන් අපකීර්තියට පත්වූයේද යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

202/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තරුණ හා ක්‍රීඩා අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කර ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(ii) එම සංගම් අතරින් නිසි පරිදි නිලවරණ පවත්වා ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(iii) නිලවරණ පැවැත්වීමට බාධා මතු වී ඇති ක්‍රීඩා සංගම් සංඛ්‍යාව හා ඒවායේ නම්;

(iv) නිලවරණ පැවැත්වීමට බාධා මතු වී ඇති ක්‍රීඩා සංගම්වල නිලවරණ පැවැත්වීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

258/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන ක්‍රීඩා පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාඨමාලා කවරේද;

(iii) එම එක් එක් පාඨමාලාව මේ වනවිට හදාරන සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ජාතික ක්‍රීඩා විද්‍යායතනය විසින් පවත්වනු ලබන ක්‍රීඩා පාඨමාලාවල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

718/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) ක්‍රීඩාංගණ සංවර්ධනය කිරීම, ක්‍රීඩා කටයුතුවලට පහසුවක් වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) මළල ක්‍රීඩාව සඳහා ශ්‍රී ලංකාව තුළ මේ වනවිට පවතින ජාත්‍යන්තර ක්‍රීඩාංගණ සංඛ්‍යාව කොපමණද;

(ii) දිස්ත්‍රික් මට්ටමින් අංග සම්පූර්ණ ක්‍රීඩාංගණ ස්ථාපනය කිරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර තිබේද;

(iii) එසේ නම්, ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

612/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කැකිරාව පොලිස් ස්ථානය මඟින් ග්‍රාම නිලධාරි කොට්ඨාස 49 ක් පමණ ආවරණය කරන අතර එහි පොලිස් නිලධාරීන් 200 ක් පමණ සේවය කරන බවත්;

(ii) එම පොලිස් ස්ථානය පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ල වසර 50 ක් පමණ පැරණි බවත්;

(iii) එම පොලිස් ස්ථානයේ ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බැරැක්ක භාවිතා කරනු ලබන නිලධාරීන් වැසි දිනවලදී ඉතා අසීරුතාවයකට පත්වන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) කැකිරාව පොලිස් ස්ථානයේ පවතින අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා මේ වනවිට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

733/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ පොලිස් සැරයන් නිලයෙන් පහළ නිලයන්වල සේවය කරනු ලබන උපාධිධාරි පොලිස් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන උසස්වීම් නොලැබීම හේතුවෙන් එම නිලධාරින් දැඩි ලෙස කළකිරීමට හා මානසික පීඩාවකට පත් වී ඇති බව පිළිගන්නේද;

(iii) එසේ නම්, එම නිලධාරින්ගේ අධ්‍යාපන සුදුසුකම්වලට සරිලන උසස්වීම් ලබා දී ඔවුන්ගෙන් ඵලදායී සේවාවක්, ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවට ලබා ගැනීමට කටයුතු කරන්නේද;

(iv) එම නිලධාරින්ට උසස්වීම් ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

කම්කරු අමාත්‍යතුමා,— සේවක අර්ථසාධක අරමුදල් පනත යටතේ නියෝගය,— 1958 අංක 15 දරන පනතේ 8 වගන්තිය සමඟ කියවිය යුතු 46 වගන්තිය යටතේ කම්කරු අමාත්‍යවරයා විසින් සාදනු ලදුව, 2021.09.21 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අධිකරණ අමාත්‍යතුමා,— සිවිල් නඩු විධාන සංග්‍රහය යටතේ නියෝගය,— (101 අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ 214 වගන්තිය සමඟ කියවිය යුතු 840 වගන්තිය යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජූලි 02 දිනැති අංක 2234/67 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.09.21 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න
**(2021 ඔක්තෝබර් 05 අඟහරුවාදා)**

816/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උතුරු පළාතේ පිහිටා ඇති ශික්ෂණ රෝහල්, දිසා රෝහල්, ප්‍රාදේශීය / මූලික රෝහල් සහ පර්යන්ත රෝහල්;

(ii) එම එක් එක් රෝහල මඟින් දෛනිකව ප්‍රතිකාර ගනු ලබන බාහිර රෝගීන්;

(iii) එක් එක් රෝහල් සඳහා අනුමත කාර්ය මණ්ඩල;

(iv) එක් එක් රෝහලේ මේ වනවිට පවතින සේවක පුරප්පාඩු;

සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත (අ) (iv) හි සඳහන් සේවක පුරප්පාඩු පුරවනු ලබන දින වකවානු කවරේද යන්න එතුමා දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත එක් එක් රෝහල සඳහා දෛනිකව ඇතුළත් කර ගනු ලබන රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත සඳහන් එක් එක් රෝහලේ තිබෙන ඇඳන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඇඳන් සංඛ්‍යාව ප්‍රමාණවත්ද;

(iv) එම රෝහල්වල මේ වනවිට පවතින භෞතික සම්පත් හිඟයට විසඳුම් ලබා දෙනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2490/2021

ගරු කේ.සුජිත් සංජය පෙරේරා මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) යටියන්තොට ප්‍රදේශයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් නාගස්තැන්න වත්ත නමින් වත්තක් තිබෙන බවත්;

(ii) එම වත්තෙන් අක්කර 1000කට වැඩි ප්‍රමාණයක් පෞද්ගලික ව්‍යාපාරිකයන් කිහිප දෙනෙකුට විකිණීමට හෝ බදු දීමට තීරණය කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා අනුගමනය කරනු ලබන ක්‍රියාපටිපාටිය කවරේද;

(ii) යටියන්තොට ප්‍රදේශයේ ජනතාවට සම්පතක් වන ඉහත සඳහන් වත්ත, ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේම තබා ගෙන සංවර්ධනය කිරීමට අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2021 ඔක්තෝබර් 08 සිකුරාදා)**

1902/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1903/2021

ගරු අනුර දිසානායක මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) වනජීවී දෙපාර්තමේන්තුව යටතේ පවතින රක්ෂිතවල නම් කවරේද;

(ii) එම එක් එක් රක්ෂිතය එසේ රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(iv) යම් ප්‍රදේශයක්, රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදනයක් අහෝසි කරමින් නිකුත් කරන ලද ගැසට් නිවේදන තිබේද;

(v) එසේ නම්, එම එක් එක් ගැසට් නිවේදනයේ අංකය සහ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(vi) එම ගැසට් නිවේදන සභාගත කරන්නේද;

(vii) ඉහත දෙපාර්තමේන්තුව යටතේ ඉදිරියේදී රක්ෂිත හෝ කළමනාකරණ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීමට සැලසුම්කර ඇති ප්‍රදේශවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2110/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව අම්පාර දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2111/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මන්නාරම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2112/2021

ගරු රවූෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුධ ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2113/2021

ගරු රවූෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මඩකලපුව දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2114/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව වවුනියා දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2115/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව මුලතිව් දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2116/2021

ගරු රවුෆ් හකීම් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) "උගත් පාඩම් හා ප්‍රතිසන්ධාන කොමිසම් සභා වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සහ උතුර හා නැගෙනහිර පළාත්වල ඉඩම් කළමනාකරණ කටයුතු විධිමත් කිරීම" යන මැයෙන් වූ අංක 11/0737/533/015 හා 2011.05.04 දිනැති අමාත්‍ය මණ්ඩල ප්‍රතිපත්තිමය තීරණය ක්‍රියාවට නැංවීමක් ලෙස "උතුරු හා නැගෙනහිර පළාත්වල පශ්චාත් යුද ගැටුම් සමයේ රජයේ ඉඩම්වලට අදාළ ගැටලු විසඳීමේ කඩිනම් වැඩසටහන" යන මැයෙන් ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අංක 2013/01 හා 2013.01.31 දිනැති චක්‍රලේඛය නිකුත් කරන ලද බව දන්නේද;

(ii) එම චක්‍රලේඛයේ 2.2.2.1, 2.2.3.4, 2.2.3.5 හා 3.5 යන වගන්ති ප්‍රකාරව යාපනය දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් කවරේද;

(iii) එම වැඩසටහන්වලදී ලබා දෙන ලද විසඳුම් කවරේද;

(iv) ගැටලු සඳහා විසඳුම් ලබා දෙන ලද එක් එක් පුද්ගලයාගේ නම සහ ලිපිනය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?